කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ දර්ශනපති උපාධි පරීක්ෂණය

**පර්යේෂණ මාතෘකාව**

# ශ්‍රී ලංකාවේ බෞද්ධ ගෘහාශ්‍රිත ආචාර ධර්ම පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

**ඉදිරිපත් කිරීම**


හික්කඩුව විතානගේ තුෂාර ද සිල්වා,
31/3,
නුගේතුඩුව පාර,
පොල්වත්ත,
අම්බලන්ගොඩ.

# හැඳින්වීම

සිංහල ආචාර ධර්ම දේශීය ඌරුව අනුව හා පැරණි භාරතීය සිරිත් විරිත් වලින් පෝෂණය වී තිබුණි. ක්‍රි. පූ. 236 දී සිදු වූ අනුබුදු මිහිඳු මාහිමියන්ගේ සම්ප්‍රාප්තියත් සමගම එම චාරිත්‍ර-වාරිත්‍ර ධර්ම බෞද්ධ මුහුණුවරක් ගනු ලැබීය. එලෙස බෞද්ධ මුහුණුවර එකතුවීමෙන් පසුව සිංහල ආචාර ධර්ම, සිංහල බෞද්ධ ආචාර ධර්ම බවට පරිවර්තනය විය. බුදුදහමේ සෙවනැල්ල ලබමින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා අනුගමනය කරමින් නිර්වාණය අවබෝධ කර ගැනීමට උත්සාහ දරනවා සේම ලෞකික ජීවිතය නිරවුල්ව නිවැරදිව ගතකිරීමට ද ඉක්බිතිව සිංහල බෞද්ධයා වැයම් කළේ ය.

උපතේ සිට මරණය දක්වාම වූ වැදගත් අවස්ථාවන්හිදීත්, වචන භාවිතයේදීත්, ගමන්-බිමන් යෑමේදීත්, රෝගාතුර වූ අවස්ථාවලදීත්, විශේෂ උත්සවවලදීත්, නැටුම්-ගැයුම්-වැයුම් ආදි කලා කටයුතුවලදීත්, පුද පූජා වලදීත්, ශාන්ති කර්මවලදීත් බෞද්ධ ආභාසය ප්‍රාප්ත විය. එසේ වුවත් ඇදහිලි විශ්වාස හා භක්තිමූලික කටයුතුවලදී හින්දු ගෘහ්‍ය ධර්මයන්ගේ ආභාසය ද නූතනය වන විටත් ශේෂව පවතියි. සිංහල පුරාණ ආචාර ධර්ම සහ හින්දු ගෘහ්‍ය ආචාර ධර්ම බෞද්ධ ආචාර ධර්ම හරහා සුපෝෂිත ව සිංහල සංස්කෘතිය, සභ්‍යත්වය ගොඩනැගෙන වග පෙනී යයි.

නූතනය වන විට බටහිරකරණයට, නාගරීකරණයට, ගෝලීයකරණයට, වාණිජකරණයට හා වෙනත් හේතු සාධක මුල් කරගෙන අප ආචාර ධර්ම නවීකරණයට බඳුන් වී තිබෙයි. නැතිනම් සම්පූර්ණ වශයෙන්ම වෙනස්වීමට භාජනය වී තිබෙයි. මේ අනුව බලන විට, නූතන සිංහල බෞද්ධ ආචාර ධර්ම පැරණි ස්වරූපයෙන් විද්‍යමාන නොවන බව උපකල්පන කරමින් "ශ්‍රී ලංකාවේ බෞද්ධ ගෘහාශ්‍රිත ආචාර ධර්ම පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්" යන ප්‍රස්තුතය පිළිබඳව පර්යේෂණය කිරීමට අරමුණු කර ගතිමි.

**පර්යේෂණ ගැටලුව :**

ශ්‍රී මහින්දාගමනයෙන් ඉක්බිතිව ශ්‍රී ලංකාවේ ගෘහාශ්‍රිත ආචාර ධර්මවලට එකතුවන බෞද්ධ ආචාර ධර්මත්, එම ආචාර ධර්ම ත්‍රිපිටකය තුළ අන්තර්ගත වන අයුරුත්, බෞද්ධ ගෘහාශ්‍රිත ආචාර ධර්ම නවීකරණය සඳහා බඳුන්වීමට බලපාන හේතු සාධකත් පිළිබඳව විමසීමට බලාපොරොත්තු විය.

**පර්යේෂණ ක්‍රමවේදය :**

ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර ග්‍රන්ථ, පුස්කොළ පොත්, සෙල් ලිපි, පුවත්පත්, සඟරා මූලික කර ගනිමින් හා ප්‍රායෝගිකව අධ්‍යයනය කරමින් තත් ගැටලුව විමසීමට අදහස් කෙළෙමි.